**රජයේ නිවේදන**

**1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත**

**3 වැනි වගන්තිය යටතේ නියමය**

සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මඟින් 2019 අප්‍රේල් මස 04 දිනැති අංක 2117/48 දරන අතිවිශෙෂ ගැසට් නිවේදනය,

(i) "2019 අගෝස්තු මස 05" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2019 ඔක්තෝබර් මස 31" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ii) එම ගැසට් නිවේදනයේ උපලේඛනය I හි I වන තීරුවේ අයිතම 2 හි "මෙම ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කළ දින සිට මාස හතරක් (04) ක් ඇතුළත" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2019 ඔක්තෝබර් මස 31 දින හෝ එදිනට පෙර " යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

සංශෝධනය කරමි.

**මංගල සමරවීර,**
**මුදල් අමාත්‍ය.**

2019 අගෝස්තු මස 08 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.